# 62 - පුරවැසි අධ්‍යාපනය II

1. (i) පුරවැසියකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු නීතිමය යුතුකම් **දෙකක්** සඳහන් කරන්න.
   (ii) ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල **දෙකක්** ලියන්න.
   (iii) මහ නගර සභාවලට පැවරී ඇති බලතල **දෙකක්** ලියන්න.
   (iv) ආර්ථික උපකාරක සේවා යටතට අයත්වන ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?
   (v) ගැටුම් ඇතිවන පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.
   (vi) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් **දෙකක්** ලියන්න.
   (vii) අතීතයේදී ශ්‍රී ලංකාවේ වෙළඳාම සඳහා පැමිණි යුරෝපීය ජාතීන් **දෙකක්** සඳහන් කරන්න.
   (viii) දේශීය නීතියට අයත්වන කොටස් **දෙකක්** නම් කරන්න.
   (ix) පවුලේ සාමාජිකයකු ලෙස ඔබට භුක්ති විඳීමට ලැබෙන අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න.
   (x) සාර්ක් සංවිධානයට අයත් සාමාජික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

**01 වන ප්‍රශ්නයේ අපේක්ෂිත ඉගෙනුම් ඵල**

- පුරවැසියකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු යුතුකම් විස්තර කරයි.
- සන්ධීය ආණ්ඩුක්‍රමයන් සහිත රාජ්‍යයන්වල බලතල බෙදා හැර ඇති ආකාරය නම් කරයි.
- ශ්‍රී ලංකාවේ මහනගර සභා සතු බලතල විස්තර කරයි.
- පරිසර පද්ධතියෙන් අපට ලැබෙන සේවාවන් පිළිබඳව විශ්ලේෂණය කරයි.
- ගැටුම් ඇතිවන විවිධ පාර්ශ්වයන් පිළිබඳ විස්තර අර්ථ දක්වයි.
- ගෝලීයකරණය හේතුවෙන් ඇතිවන බලපෑම් විස්තර කරයි.
- ශ්‍රී ලංකාව බහුසංස්කෘතික සමාජයක් වීමට බලපෑ හේතු විමර්ශනය කරයි
- නීතිය හා එහි ප්‍රභේද පිළිබඳව විග්‍රහ කරයි.
- සාමාජයේ සාමාජිකයන් ලෙස අපට භුක්ති විඳිය හැකි අයිතිවාසිකම් විශ්ලේෂණය කරයි.
- ජාත්‍යන්තර සබඳතා සඳහා ආරම්භ කර ඇති සංවිධානවල ව්‍යුහය පැහැදිලි කරයි.
- 

1. (i) පුරවැසියකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු නීතිමය යුතුකම් **දෙකක්** සඳහන් කරන්න.

- රජය විසින් පනවනු ලබන බදු ගෙවීම
- පවතින නීතියට ගරු කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම
- සාමය ආරක්ෂා කිරීමට සහයවීම
- පොදු දේපල ආරක්ෂා කිරීම

**(ඉහත සඳහන් කර ඇති ඕනෑම දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් දෙන්න. මෙම අදහස්වලට සමාන අදහස ලැබෙන ආකාරයේ පිළිතුරු ලියා ඇත්නම් ඒවාද සැලකිල්ලට ගන්න) (ලකුණු 02)**

(ii) ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල **දෙකක්** ලියන්න.

- බදු පැනවීම හා එකතු කිරීම
- මූල්‍ය කටයුතු
- ජාතික ආරක්ෂාව සැලසීම
- විදේශ වෙළඳාම
- විදේශ කටයුතු
- ජාතික ආර්ථික සංවර්ධනය

**මෙම බලතලවලින් දෙකක් ලියා තිබිය යුතුය. එක් බලතලයකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න (ලකුණු 02)**

(iii) මහ නගර සභාවලට පැවරී ඇති බලතල **දෙකක්** ලියන්න.

- නාගරික කලාපවලට ජලය සැපයීම
- විදුලි ආලෝකය සැපයීම
- නගර අලංකාර කිරීම
- කුණු කසල ඉවත් කිරීම
- අලුත් මාර්ග ඉදිකිරීම
- නිවාස යෝජනා ක්‍රම සකස් කිරීම
- පුස්තකාල පහසුකම් ඇති කිරීම
- ප්‍රජා ශාලා ඇති කිරීම
- ක්‍රීඩා පිටි ක්‍රීඩාගාර පවත්වා ගෙන යාම
- පොදු වැසිකිලි කැසිකිලි පවත්වා ගෙන යාම
- විනෝද ස්ථාන පාලනය කිරීම
- කිරුම් මිනුම් කටයුතු පාලනය කිරීම
- සුළු වාරිමාර්ග නඩත්තුව
- පොදු ළිං පොදු නාන ස්ථාන පවත්වා ගෙන යාම

**ඉහත සඳහන් කර ඇති කරුණුවලින් දෙකක් ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න. (ලකුණු 02)**

(iv) ආර්ථික උපකාරක සේවා යටතට අයත්වන ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?

- අමුද්‍රව්‍ය (භූමිය ඛනිජ සම්පත් රසායනික මූලද්‍රව්‍ය දැව ශාක හා සත්ව ආහාරපාන ආදිය)
- ශක්තිය ( සූර්ය බලය පොසිල ඉන්ධන ජීව වායු භූ තාපය ජල විදුලිය සුළං බලය ආදිය)

**ඉහත සඳහන් මූලික ආර්ථික උපකාරක සේවා දෙක ලියා ඇත්නම් එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න. එම උපකාරක සේවාවන් යටතට අයත් වන සාධක දෙකක් එම අංශ දෙක අනුව වෙන වෙනම ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු සේ සලකා ලකුණු ලබා දෙන්න (ලකුණු 02)**


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

රහස්‍ය ලේඛනයකි

(v) ගැටුම් ඇතිවන පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.

- පුද්ගලයා තුළ
- පුද්ගලයින් අතර
- ජන කණ්ඩායම් අතර
- රටවල් අතර

**ඉහත අකාරයට ගැටුම් හටගන්නා පාර්ශ්ව දෙකක් ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න. (ලකුණු 02)**

(vi) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් **දෙකක්** ලියන්න.

- විදේශ ආයෝජන ගලා ඒම
- නව තාක්ෂණය ලබා ගත හැකිවීම
- නව රැකියා අවස්ථා නිර්මාණය වීම
- රැකියා වියුක්තිය අඩුවීම
- දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇතිවීම
- කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම
- ජාත්‍යන්තර වෙළඳපොල පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහිවීම
- ගෙවුම් ශේෂය යහපත්වීම
- ආර්ථිකය විවිධාංගීකරණය වීම
- ගුණාත්මක බවින් ඉහල නිර්මාණ බිහිවීම
- විදේශීය විශේෂඥ දැනුම මෙරටට ගලා ඒමා
- නිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණුවීම
- දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

**මෙවැනි ධනාත්මක බලපෑම් දැක්වෙන කරුණු දෙකක් සඳහන් කර තිබිය යුතුය. එසේම මෙම පිළිතුරුවලින් පිට ධනාත්මක බලපෑම් දැක්වෙන වෙනත් පිළිතුරු ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. (ලකුණු 02)**

(vii) අතීතයේදී ශ්‍රී ලංකාවේ වෙළදාම සඳහා පැමිණි යුරෝපීය ජාතීන් **දෙකක්** සඳහන් කරන්න.

- යුරෝපා ජාතිකයන්
  - පෘතුගීසි
  - ලන්දේසි
  - ඉංග්‍රීසි

**යුරෝපීය ජාතීන් වර්ග දෙකක් ලියා තිබීම අවශ්‍යය. මෙම ජාතීන් හැර වෙනත් ජාතීන් ගේ නම් ලියා ඇත්නම් ලකුණු ලබා නොදෙන්න (ලකුණු 02)**

(viii) දේශීය නීතියට අයත්වන කොටස් **දෙකක්** නම් කරන්න.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය
- අපරාධ නීතිය
- සිවිල් නීතිය

**මෙම පිළිතුරු අතරින් ඕනෑම දෙකක් ලියා ඇත්නම් නිවැරදි පිළිතුරු ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 02)**

(ix) පවුලේ සාමාජිකයකු ලෙස ඔබට භුක්ති විඳීමට ලැබෙන අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න.

- ආහාර ලබා ගැනීම
- පෝෂණය ලබා ගැනීම
- ආදරය හා සෙනෙහස
- ආරක්ෂාව හා රැකවරණය
- අධ්‍යාපනය ලැබීම
- ඇඳුම් පැළඳුම් ලබා ගැනීම

**ඉහත ආකාරයෙන් පවුලකින් අපට හිමිවන අයිතිවාසිකම් දෙකක් ලියා තිබීම අවශ්‍යයි. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලබා දෙන්න. (ලකුණු 02)**

(x) සාර්ක් සංවිධානයට අයත් සාමාජික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

- ශ්‍රී ලංකාව
- මාලදිවයින
- නේපාලය
- පකිස්ථානය
- ඇෆ්ගනිස්ථානය
- බංග්ලා දේශය
- භූතානය
- ඉන්දියාව

**මෙම රටවල් අතුරින් ඕනෑම දෙකක ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් දෙන්න.(ලකුණු 02)**

**(1 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 2 x 10 =20 )**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

2. ගෝලීයකරණ ක්‍රියාවලියත් සමග ලෝකයේ බොහෝ රටවල් බහු සංස්කෘතික ජන සමාජයන් බවට පරිවර්තනය වෙමින් පැවතීම ප්‍රධාන ප්‍රවනතාවක් වේ.

(i) ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රධාන ජනවර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් අනුගමනය කළ යුතු සමාජ හා සංස්කෘතික සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජය තුළ විවිධ ජන වර්ග අතර විශ්වාසය ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් බහු සංස්කෘතික ජන සමාජයකට අත්පත් කරගත හැකි වාසි **දෙකක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

***2 වන ප්‍රශ්නයේ අපේක්ෂිත ඉගෙනුම් ඵල***

- *බහුසංස්කෘතික සමාජ ආරම්භ වීමට බලපාන මූලාශ්‍ර විස්තර කරයි.*
- *බහුසංස්කෘතික සමාජයක පුරවැසියන් අනුගමනය කළ යුතු සමාජ හා සංස්කෘතික සාධක පැහැදිලි කරයි.*
- *බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් ප්‍රගුණ කළ යුතු ගුණාංග විස්තර කරයි.*
- *බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් ප්‍රගුණ කළ යුතු ගුණාංග නිසා ඇති වන වාසි විග්‍රහ කරයි.*

(i) ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රධාන ජනවර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- සිංහල
- ශ්‍රී ලංකා දෙමළ
- ඉන්දියානු දෙමළ
- මුස්ලිම් / යෝනක
- බර්ගර්
- මැලේ
- වැදි ජනතාව (ආදිවාසීන්)

**මෙම ජාතීන් අතුරින් ඕනෑම දෙකක් ලියා තිබිය යුතුය. එක් නිවැරදි කරුණක් සඳහා එක ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න. (මුළු ලකුණු 02)**

(ii) බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් අනුගමනය කළ යුතු සමාජ හා සංස්කෘතික සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

- කැමති ආගමක් ඇදහීම
- සිරිත් විරිත් අනුගමනය කිරීම
- විවිධ උත්සව පැවැත්වීම
- කැමති ප්‍රදේශයක ජීවත්වීම
- විවිධ භාෂාවන් ඉගෙනීම
- විවිධ භාෂාවන් භාවිතය
- නිදහසේ ගමනාගමනය
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

**බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් අනුගමනය කළ යුතු සමාජ හා සංස්කෘතික සාධක ඉහත දක්වා ඇත. ඒ අතුරින් ඕනෑම තුනක් ලියා තිබිය යුතුය. එක් නිවැරදි කරුණකට එක් ලකුණක් බැගින් ලකුණු තුනක් ලබා දෙන්න. (මුළු ලකුණු 03)**



Past Papers Wiki

(iii) (a) ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජය තුළ විවිධ ජන වර්ග අතර විශ්වාසය ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම
- අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම
- එකිනෙකාට ගරු කිරීම
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම
- සාමූහිකත්වය වර්ධනය කිරීම
- එක්සත්ව කටයුතු කිරීම
- අනෙකුත් ජනවර්ගවල භාෂාව ඉගෙනීම හා භාවිතය
- සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අන්‍ය මත ඉවසීම
- අන්‍ය මතයන්ට ගරු කිරීම
- සමානාත්මතාවය

**බහු සංස්කෘතික සමාජයේ යහපැවැත්ම සඳහා විවිධ ජනවර්ග අතර විශ්වාසය ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඉහත දැක්වේ. ඒ අතුරින් දෙකක් නිවැරදිව ලියා ඇත්නම් එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න. මෙවැනි අදහසක් මතුවන ආකාරයට ලියා ඇති වෙනත් පිළිතුරුද නිවැරදි පිළිතුරු ලෙස සලකා ලකුණු ලබා දිය හැකිය.** **(මුළු ලකුණු 02)**

(b) ඉහත (a) හි සඳහන් කරන ලද ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් බහු සංස්කෘතික ජන සමාජයකට අත්පත් කරගත හැකි වාසි **දෙකක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ
- ගැටුම් අවම වේ
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ
- එක් ජාතියක් එක් රටක් යන හැඟීම වර්ධනය වේ
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ
- අන්‍ය ආගම් හා සංස්කෘතීන්ට අගරු නොවන සේ හැසිරීමට හුරු පුරුදු වේ
- ජාතික සංවර්ධනය සඳහා දායක වේ.

ඉහතින් සඳහන් කරන ලද කරුණුවලින් දෙකක් නම් කර තිබිය යුතුය. විශ්වාසය තහවුරු වන ආකාරයේ වෙනත් පිළිතුරුද නිවැරදි පිළිතුරු සෙ 'සලකන්න. ඉන් එක් කරුණක් තෝරා ගෙන එය කෙටියෙන් විස්තර කිරීම අවශ්‍ය වේ සුදුසු නිදසුන් සැලකිල්ලට ගෙන විස්තර කිරීම අවශ්‍යය.

කරුණු දෙකක් නම් කිරීමට ලකුණු 1
විස්තර කිරීමට ලකුණු 2

(මුළු ලකුණු 03)
(2 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. වර්තමානයේදී පරිසරය පිළිබඳව දැඩි අවධානයට යොමු වී ඇත්තේ පරිසරය විවිධ විපර්යාසවලට ගොදුරු වීම නිසා මිනිස් ජීවිතවලට එහි බලපෑම් ඇති වන බැවිනි.
(i) පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන සාධක **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)
(ii) පරිසරය සම්බන්ධව පුරවැසියන් සතු වගකීම් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) (*a*) දේශගුණික වෙනස්වීම් නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
(*b*) ඉහත (*a*) හි සඳහන් අහිතකර ප්‍රතිඵල අවම කරගැනීම සඳහා පුරවැසියකුට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

***3 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල***

- *පරිසරය තුළ ගැටලු නිර්මාණය වීමට බලපාන ප්‍රධාන සාධක පැහැදිලි කරයි*
- *පරිසරය සම්බන්ධව පුරවැසියන් සතු වගකීම් විශ්ලේෂණය කරයි.*
- *දේශගුණික වෙනස්වීම් නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක ඇගයීමට ලක් කරයි*
- *පරිසරයට ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කර ගැනීමට පුරවැසියකුට ගත හැකි ක්‍රියාමාර්ග විග්‍රහ කරයි*

(i) පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන සාධක **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

- ස්වභාවික ක්‍රියාකාරකම්
- මානව ක්‍රියාකාරකම් (මිනිස් ක්‍රියාකාරකම්)

**මෙම ක්‍රියාකාරකම් දෙක නම් කර තිබීම අවශ්‍යය. අනුපිළිවෙලින් ලියා තිබීම අවශ්‍ය නොවේ. මානව ක්‍රියාකාරකම් යන්න මිනිස් ක්‍රියාකාරකම් ලෙස ලියා තිබුණද නිවැරදි පිළිතුරක් සේ සලකන්න නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න. (මුළු ලකුණු 02)**

(ii) පරිසරය සම්බන්ධව පුරවැසියන් සතු වගකීම් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

- පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය
- නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය
- නිවස හා අවට පරිසරයේ රුක් රෝපණය කිරීම
- පරිසරයේ පැවැත්ම හා වැදගත්කම වටහා ගෙන කටයුතු කිරීම
- පරිසරය සුරැකීම පිළිබඳව අන් පුද්ගලයන් දැනුවත් කිරීම
- පරිසර නීතිවලට අනුකූලව කටයුතු කිරීම
- පරිසරය සම්බන්ධව කටයුතු කරන ආයතනවලට පූර්ණ අනුග්‍රහය ලබා දීම
- පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම

**ඉහත සඳහන් කරුණුවලින් ඕනෑම කරුණු තුනක් ලියා තිබිය යුතුය. මීට සමාන අදහස් ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු 03 ක් ලබා දෙන්න. (මුළු ලකුණු 03)**

(iii) (*a*) දේශගුණික වෙනස්වීම් නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

- ලෝකයේ සාමාන්‍ය උෂ්ණත්වය ඉහළ යාම
- වර්ෂණ ක්‍රියාවලිය වෙනස්වීම
- අකුණු කුණාටු ටොනාඩෝ අයිස් වැසි වැනි ආන්තික සිදුවීම
- එල්නිනෝ බලපෑම
- මෝසම් ක්‍රියාවලියට බලපෑම
- හිම හා අයිස් වැස්ම දියවී යාම
- සාගර ජල මට්ටම ඉහළ යාම
- කෘෂි අස්වනු අඩුවීම
- රෝග ව්‍යාප්තිය වැඩිවීම

**මෙවැනි හේතු දෙකක් සඳහන් කර තිබීම අවශ්‍යයි. මෙයට සමාන වෙනත් අදහස් ලියා ඇත්නම් ඒවාද සැලකිල්ලට ගන්න. ආන්තික සිදුවීම් සඳහා උදාහරණ දෙකක් ලියා ඇත්නම් එක් ලකුණක් දෙන්න එක් නිවැරදි පිළිතුරකට ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**
(මුළු ලකුණු 02)

(*b*) ඉහත (*a*) හි සඳහන් අහිතකර ප්‍රතිඵල අවම කරගැනීම සඳහා පුරවැසියකුට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

- පරිසරයට හිතකර වායු මුදා හැරීමට කටයුතු කිරීම
- පරිසරය සම්බන්ධ දැනුවත් කිරීම
- පරිසරයට හානි කරන පුද්ගලයන් නීතියට අල්ලා දීම
- ජලගැලීම් පාලනයට ක්‍රියා කිරීම
- අපද්‍රව්‍ය නිවැරදිව බැහැර කිරීම හා ප්‍රතිචක්‍රීයකරණය
- රුක් රෝපණය කිරීමට දිරි ගැන්වීම
- පරිසරයට හානි කරන ක්‍රියාවලින් වැළකීම
- අහිතකර වායු විමෝචනය පාලනය කිරීම (වාහන දුම් පරීක්ෂාව)

**මෙවැනි පිළිතුරු ශිෂ්‍යයන්ට ලබා දිය හැකිය. පිළිතුරේ නිවැරදිභාවය කරුණුවල සාරවත්භාවය අනුව ලකුණු පැවරීම කරන්න. එක් ක්‍රමයක් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය.**

**ක්‍රියාමාර්ග දෙකක් නම් කිරීම සඳහා** ලකුණු 01

විස්තර කිරීමට ලකුණු 02

(මුළු ලකුණු 03)

( 3 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතන අතර බලය බෙදාහැර පාලනය කිරීම වර්තමානයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

(i) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් **තුන** මොනවා ද? (ලකුණු 03 යි)

(iii) (*a*) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතු විය යුතු වැදගත් ගුණාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාර්ථකත්වයට නිදහස් හා අපක්ෂපාතී ජනමාධ්‍යයකින් ඉටුවිය යුතු සේවාවන් **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

*4 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල*

- *රාජ්‍යයන්හි දක්නට ලැබෙන විවිධ ස්වරූප විස්තර කරයි.*
- *ව්‍යවස්ථාදායක මණ්ඩලයේ කාර්යයන් විමර්ශනය කරයි.*
- *ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු ඇති කරගත යුතු ගුණාංග පැහැදිලි කරයි.*
- *නිදහස් හා අපක්ෂපාති ජනමාධ්‍යයක් යහපැවැත්මට හේතුවන ආකාරය සාකච්ඡා කරයි.*

(i) **රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.** (ලකුණු 02 යි)

- ඒකීය රාජ්‍යය
- සන්ධීය රාජ්‍යය/පෙඩරල් රාජ්‍ය

**ඉහත සඳහන් රාජ්‍ය වර්ග දෙක ලියා ඇත්නම් නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. සන්ධීය රාජ්‍ය වෙනුවට පෙඩරල් රාජ්‍ය ලෙස ලියා තිබුණද ලකුණු ලබා දෙන්න. එක් නිවැරදි කරුණකට ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.** (මුළු ලකුණු 02)

(ii) **ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් තුන මොනවා ද?** (ලකුණු 03 යි)

- නීති සම්මත කිරීම
- මුදල් පාලනය කිරීම
- විධායකය පාලනය කිරීම
  - ප්‍රශ්න ඇසීම
  - මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම
  - ආණ්ඩුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග විවේචනය කිරීම
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම
  - දෝෂාභියෝග ඉදිරිපත් කිරීම
  - විශ්වාසභංග යෝජනා ඉදිරිපත් කිරීම

**මෙම කරුණු තුන නිවැරදි පිළිතුර වේ. නමුත් 11 ශ්‍රේණියේ 37 පිටුවේ මීට අමතරව වෙනත් කාර්යයන්ද දක්වා ඇත. එම කරුණුද ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු ලෙස සලකා ලකුණු ලබා දිය හැකිය. නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු 03 ක් ලබා දෙන්න.**

(මුළු ලකුණු 03)

(iii) (*a*) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතු විය යුතු වැදගත් ගුණාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

- සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
- විරුද්ධ මත ඉවසීම
- බහුතර මතයට ගරු කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම
- නීතිගරුක වීම
- තම යුතුකම නිවැරදිව ඉටු කිරීම
- ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුතුවලට විරුද්ධ වීම

**මෙම පිළිතුරු හෝ මීට සමාන අදහස් ඇති කරුණු දෙකක් ලිවීම අවශ්‍යයි. නිවැරදි එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.** (මුළු ලකුණු 02)

(*b*) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාර්ථකත්වයට නිදහස් හා අපක්ෂපාතී ජනමාධ්‍යයකින් ඉටුවිය යුතු සේවාවන් **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

- සත්‍ය තොරතුරු ලබා දීම
- අපක්ෂපාතිව තොරතුරු වාර්තා කිරීම
- වගකීමෙන් යුතුව කටයුතු කිරීම
- මහජන සාමයට හානිකර පුවත් ඉදිරිපත් නොකිරීම
- නිවැරදි ජනමතයක් ගොඩ නැගීම

**ඉහත දක්වා ඇති කරුණු හෝ එවැනි අදහස් මතුවන ආකාරයේ කරුණු දෙකක් නම් කර තිබීම අවශ්‍යයි. ඉන් එක් කරුණක් කෙටියෙන් විස්තර කර තිබේ නම් ලකුණු දෙකක් දෙන්න. ශිෂ්‍යයන් මේ සම්බන්ධව නිර්මාණාත්මක ලෙස ලියා ඇති පිළිතුරු සඳහා උපරිම ලකුණු ලබා දෙන්න.**

**ක්‍රියාමාර්ග දෙකක් නම් කිරීම සඳහා ලකුණු 01**

**විස්තර කිරීමට ලකුණු 02**

**(මුළු ලකුණු 03)**

**(4 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5. පුද්ගලයන් තුළ පවතින අරමුණු, අභිලාෂයන් හා අවශ්‍යතාවන් හේතු කොටගෙන ඔවුන් අතර ගැටුම් නිර්මාණය වේ.

(i) අන්තර්ජාතික ගැටුම් වර්ග කළ හැකි ආකාර දෙක ලියන්න. (ලකුණු 02 යි)

(ii) යම් පුද්ගලයකු තුළ හෝ පුද්ගලයන් අතර ගැටුමක් නිර්මාණය වීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ගැටුම් නිරාකරණය කිරීම සඳහා 'මැදිහත්කරණය' යොදා ගතහැකි අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ගැටුම් නිරාකරණයේදී පාසල් ශිෂ්‍යයකු විසින් පුහුණු කරගත යුතු පුද්ගල ගුණාංග දෙකක් සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

*5 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල*

- *විවිධ වර්ගයේ අන්තර්ජාතික ගැටුම් වර්ග කරයි.*
- *ගැටුමක් නිර්මාණය වීමට බලපාන සාධක පිළිබඳව විමසා බලයි.*
- *ගැටුම් නිරාකරණයේදී මැදිහත්කරණය යොදා ගත හැකි අවස්ථා විස්තර කරයි.*
- *ගැටුම් වළක්වා ගැනීම සඳහා පුරවැසියකු ලෙස පුහුණු කර ගත යුතු පුද්ගල ගුණාංග පැහැදිලි කරයි.*

(i) **අන්තර්ජාතික ගැටුම් වර්ග කළ හැකි ආකාර දෙක ලියන්න.** (ලකුණු 02 යි)

- මතවාදී ගැටුම්
- යුධමය ගැටුම්

**මෙම කරුණු දෙක ලියා ඇත්නම් එක් කරුණක් සඳහා එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් දෙන්න.**

**(මුළු ලකුණු 02)**

(ii) **යම් පුද්ගලයකු තුළ හෝ පුද්ගලයන් අතර ගැටුමක් නිර්මාණය වීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න.** (ලකුණු 03 යි)

- අන් අයගේ මතයන්ට සංවේදී නොවීම
- අන් අයට සවන් නොදීම
- නොසලකා හැරීම
- ගෞරව නොකිරීම
- කෝපය ඇතිවන ආකාරයේ වචන භාවිතය
- කලහකාරී ලෙස හැසිරීම
- කේලාම් කීම

* විවිධ දෘෂ්ටි * මානසික තත්ත්වය + සීමා ආකල්ප

**මෙවැනි ආකාරයේ කරුණු ලියා තිබිය යුතුය. මෙම අදහස් වෙනත් ආකාරයකින් ලියා තිබුණද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු තුනක් උපරිම ලබාදිය හැකිය.** **(මුළු ලකුණු 03)**

වෙනත් අදහස් / හමුවීම නිවැරදි නොවීම / අනන්‍යතා ආකල්ප

(iii) (*a*) ගැටුම් නිරාකරණය කිරීම සඳහා 'මැදිහත්කරණය' යොදා ගතහැකි අවස්ථා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

- පවුල් ආරවුල්
- පාරිභෝගික හා වෙළඳ ආරවුල්
- කුලී නිවැසියන් හා අයිතිකරුවන් අතර ආරවුල්
- සේව්‍ය සේවක ආරවුල්
- වැඩිහිටි දෙමාපියන් සම්බන්ධ ආරවුල්
- ජාතීන් අතර පවතින ගැටුම් / රටවල් අතර පවතින ගැටුම්

**ඉහත සඳහන් කර ඇති කරුණුවලින් ඕනෑම දෙකක් ලියා තිබිය යුතුය. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණු දෙක බැගින් ලකුණු දෙකක් ලබා දිය හැකිය.** (මුළු ලකුණු 02)

(*b*) ගැටුම් නිරාකරණයේදී පාසල් ශිෂ්‍යයකු විසින් පුහුණු කරගත යුතු පුද්ගල ගුණාංග **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

- ආත්මාවබෝධය
- ඉවසීම
- කරුණාව හා මෛත්‍රිය
- නිර්මාණාත්මක චින්තනය
- ඵලදායී තීරණ ගැනීම
- මුදිතාව
- දරාගැනීමේ ශක්තිය
- ඵලදායී සන්නිවේදනය
- සංවේදිබව
- අවිහිංසාව

**ශිෂ්‍යයකු ලෙස තමන්ට මුහුණ දීමට සිදුවන ගැටුම් නිරාකරණය කර ගැනීමේදී ඔහු විසින් අනුගමනය කළයුතු පුද්ගල ගුණාංග දෙකක් සඳහන් කර තිබිය යුතුය. එම ගුණාංග දෙක අතුරින් එක් ගුණාංගයක් විස්තර කර තිබිය යුතුය. ලකුණු ලබා දීමේදී ශිෂ්‍යයාගේ පිළිතුරේ නිවැරදිබව මෙන්ම නිර්මාණාත්මක හා ප්‍රායෝගික බවද සැලකිල්ලට ගන්න.**

**පුද්ගල ගුණාංග දෙකක් නම් කිරීම සඳහා ලකුණු 01**

**විස්තර කිරීමට ලකුණු 02**

(මුළු ලකුණු 03)

( 5 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6. මිනිස් සමාජය තුළ ක්‍රමයෙන් දියුණුව කරා ගමන් කළ බැවින් පුද්ගලයන් සතු මානව හිමිකම් ලබා ගැනීම කෙරෙහි ද මිනිසාගේ දැඩි අවධානය යොමු වන්නට විය.
   (i) අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාවලියේදී දක්නට ලැබෙන ප්‍රධාන පාර්ශ්ව **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)
   (ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පදනම් කරගෙන ඇති මූලධර්ම **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   (iii) (*a*) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා රජය මගින් සලසා ඇති විශේෂ පහසුකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (*b*) ඔබේ පාසලේ සිටින විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට උදව් කළ හැකි ආකාර **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

*6 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල*

- *මානව අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වයන් සොයා බලයි.*
- *ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පදනම් කරගෙන ඇති මූලධර්ම විමර්ශනය කරයි.*
- *විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙනුවෙන් ගෙන ඇති විශේෂ පියවර පැහැදිලි කරයි.*
- *විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට පාසල් ශිෂ්‍යයන් ලෙස ඉටු කළ හැකි යුතුකම් විමර්ශනය කරයි.*

(i) අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාවලියේදී දක්නට ලැබෙන ප්‍රධාන පාර්ශ්ව **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

- අයිතිවාසිකම් ඉල්ලා සිටින්නන්
- අයිතිවාසිකම් ලබා දීමට බැඳී සිටින්නන්

**ඉහත සඳහන් පාර්ශව දෙක ලියා තිබීම අවශ්‍යයි. මෙම අදහස මතුවන ආකාරයට ශිෂ්‍යයන්ගේ වචනවලින් ලියා ඇති කරුණුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. නිවැරදි පිළිතුරකට ලකුණු එකක් බැගින් කරුණු දෙකට ලකුණු දෙකක් දෙන්න.** (මුළු ලකුණු 02)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පදනම් කරගෙන ඇති මූලධර්ම **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

- ළමයාගේ උපරිම යහපත
- සහභාගිත්වය
- පැවැත්ම හා සංවර්ධනය
- වෙනස් කොට නොසැලකීම

**ඉහත සඳහන් මූලධර්ම හතරෙන් තුනක් ලියා තිබිය යුතුය. පැවැත්ම හා සංවර්ධනය කරුණු දෙකක් ලෙස ලියා ඇත්නම් එය එකක් සෙ 'සලකන්න මෙම අදහස මතුවන ආකාරයට ශිෂ්‍යයන්ගේ වචනවලින් ලියා ඇති කරුණුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. නිවැරදි පිළිතුරකට ලකුණු එකක් බැගින් කරුණු තුනට ලකුණු තුනක් දෙන්න.** (මුළු ලකුණු 03)

(iii) (*a*) **විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා රජය මඟින් සලසා ඇති විශේෂ පහසුකම් දෙකක් සඳහන් කරන්න.** (ලකුණු 02 යි)

- රජයේ ගොඩනැගිලි සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීම
- මුදල් නෝට්ටු හඳුනා ගැනීමට හැකි ආකාරයට අංක යෙදීම
- පදික වේදිකාවල විශේෂ මංතීරු සකස් කිරීම
- විශේෂ රූපවාහිනී වැඩසටහන් හා ප්‍රවෘත්ති සංඥා භාෂාවෙන්ද ඉදිරිපත් කිරීම
- විශේෂ පාසල් ආරම්භ කිරීම
- සාමාන්‍ය පාසල්වල විශේෂ ඒකක ඇති කිරීම
- ඇතැම් ආයතනවල ආබාධිතයන් සඳහා වෙනම වැසිකිළි ඇති කිරීම
- රජයේ රැකියාවලට බඳවා ගැනීමේදී විශේෂ අවශ්‍යතා අය සඳහා යම් ප්‍රතිශතයක් වෙන් කර තිබීම
- රජයේ විභාගවලදී විශේෂ වරප්‍රසාද ලබාදීම

[illegible]

**රජය විසින් ගෙන ඇති මෙම ක්‍රියාමාර්ග අතරින් ඕනෑම කරුණු දෙකක් ලිවිය යුතුය. මීට අමතරව වෙනත් යෝග්‍ය පිළිතුරු ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු සේ සලකන්න මෙම අදහස මතුවන ආකාරයට ශිෂ්‍යයන්ගේ වචනවලින් ලියා ඇති කරුණුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. නිවැරදි පිළිතුරකට ලකුණු එකක් බැගින් කරුණු දෙකට ලකුණු දෙකක් දෙන්න. (මුළු ලකුණු 02)**

(*b*) **ඔබේ පාසලේ සිටින විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට උදව් කළ හැකි ආකාර දෙකක් සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.** (ලකුණු 03 යි)

- පාඩම් කියවා අසා සිටින්නට සැලැස්වීම
- පන්ති අතර මාරුවීමේදී සහාය වීම
- නිවසට යාමට හා ඒමට උදව් කිරීම
- දුෂ්කර පාඩම් නැවත කියාදීම
- ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීම:(කන් නොඇසීම වැනි දේ)

**මෙ ආකාරයට පාසල් ශිෂ්‍යයකු ලෙස විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යයන්ට උපකාර කළ හැකි ආකාර දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කර තිබීම අවශ්‍ය ය. නම්කර පමණක් ඇත්නම් ලකුණු එකක් පමණක් දෙන්න. විස්තර කිරීමට ලකුණු දෙකක් ලබා දෙන්න.**

**කරුණු දෙකක් නම් කර තිබීමට ලකුණු 01**

**එකක් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 02**

**(මුළු ලකුණු 03)**

**( 6 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

7. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මහජනතාවගේ ජීවිත, අයිතිවාසිකම් හා දේපොළ ආරක්ෂා වන අයුරින් මානව හැසිරීම පාලනය කිරීමයි.

(i) ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන් **දෙදෙනෙක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත්වීමෙන් ඇති විය හැකි වාසි **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

**7 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල**

- *ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ දක්නට ඇති විශේෂ නීති හඳුනා ගනියි.*
- *ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලයන් පැහැදිලි කරයි.*
- *නීතිය ක්‍රියාවට නංවන ප්‍රධාන නිලධාරීන් විස්තර කරයි.*
- *නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත්වීමෙන් අත්වන වාසි විමර්ශනය කරයි.*

(i) **ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග දෙකක් සඳහන් කරන්න.** (ලකුණු 02 යි)

- මුස්ලිම් නීතිය
- තේසවලාමේ නීතිය
- උඩරට නීතිය

**මෙම විශේෂ නීති අතුරින් ඕනෑම දෙකක් ලියා ඇත් නම් එකකට එක ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න. ළමයා මෙම අනුපිළිවෙලටම ලියා තිබීම අවශ්‍ය නොවේ** (මුළු ලකුණු 02)

(ii) **ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලයන් තුනක් සඳහන් කරන්න.** (ලකුණු 03 යි)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය
- මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධ පෙත්සම් විභාග කිරීමේ බලය
- උපදේශාත්මක අධිකරණ බලය
- පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ අධිකරණ බලය
- ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය
- ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
- රිට් සැකසීමේ බලය
- අවසාන අභියාචනාධිකරණ බලය

**ඉහත සඳහන් කරුණු අතරින් තුනක් ලියා තිබිය යුතුය. ශිෂ්‍යයන් මෙම අදහස මතු වන ආකාරයටලියා ඇති සුදුසු පිළිතුරුද සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. ශිෂ්‍යයා කරුණු තුනක් ලියා තිබිම අවශ්‍යය.** (මුළු ලකුණු 03)

(iii) (*a*) නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන් **දෙදෙනෙක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

- අධිකරණ ඇමතිතුමා
- අග්‍රවිනිශ්චයකාර තුමා
- නීතිපතිතුමා

**මෙම නිලධාරීන් අතුරින් දෙදෙනෙක් නම් කර තිබෙනම් ලකුණු දෙකක් ලබා දෙන්න**

**(මුළු ලකුණු 02)**

(*b*) **නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත්වීමෙන් ඇති විය හැකි වාසි දෙකක් සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.** (ලකුණු 03 යි)

- පුද්ගලයන් තුළ නීතිය හා අධිකරණය පිළිබඳව විශ්වාසයක් ඇතිවීම
- රටතුළ අපරාධ හා දූෂණ අවම වීම
- සමානව සැමට නීතිය ක්‍රියාත්මක වීම
- අධිකරණය ක්‍රියාවලින්ට යොමු නොවී සිටීමට හැකිවීම
- නීතිය හා සාමය ආරක්ෂාවීම
- පුද්ගලයන් අතර ගැටුම් නිර්මාණය නොවීම

**මෙම කොටසට නිදහස් පිළිතුරු අපේක්ෂා කෙරේ. ශිෂ්‍යයන් ගැලපෙන මෙවැනි ආකාරයේ පිළිතුරු ලබා දී ඇත්නම් ඒවායේ නිවැරදිබව අනුව ලකුණු ලබා දීමට කටයුතු කරන්න. ඉන් එකක් කරුණක් නිසා සමාජයේ ඇති විය හැකි යහපත විස්තර කර තිබීමද අවශ්‍යය. නම් කර පමණක් ඇත්නම් එක් ලකුණක් පමණක් දෙන්න. විස්තර කර ඇත්නම් ඒ සඳහා ලකුණු දෙකක් ලබා දෙන්න.**

**කරුණු දෙකක් නම් කර තිබීමට ලකුණු 01**
**එකක් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 02**

**(මුළු ලකුණු 03)**

**(7 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)**


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න